## අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ වසංගතය සමඟ කටයුතු කිරීමේදී අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කරන්න.

උග්‍රවන වසංගත තත්වය, අඛණ්ඩ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හා නීතියේ ආධිපත්‍යය පිරිහීම පිළිබඳව මෙම ලේඛනයේ සම අත්සන්කරුවන් වන, ශ්‍රී ලංකාව පුරා සිටින සංවිධාන සහ වෘත්තීය සමිතීන් වන අපගේ බරපතල කනස්සල්ල පළ කරන අතරම මෙම අවදානම් වෛරසය පැතිරීම වැළැක්වීමට සහ ඉන් බලපෑමට ලක්වූවන් රැකබලා ගැනීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සහ වෙනත් බොහෝ ක්ෂේත්‍රවල සිටින අයගේ උත්සාහය අප අගය කරමු.

එන්නත් ලබා දීම සඳහා පැහැදිලි ප්‍රමුඛතාවයක් ලබා නොදීම, සංවිධිත ක්‍රියාවලියක් නොමැති වීම, PCR පරීක්ෂණ සංඛ්‍යාව අඩු කිරීම තුලින් වාර්ථාවන COVID-19 රෝගය වැලඳුන රෝගීන් ප්‍රමානය කෘතිමව අඩු කිරීම, සහ සෞඛ්‍ය සේවකයින්ට ප්‍රමාණවත් සහායක් නොලැබී ඇති බවට වාර්තා වීම ගැන අපි කනගාටු වෙමු. එසේම, බොහෝ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වලට එන්නත් කිරීම සහ PCR පරීක්ෂණ පැවැත්වීම කෙරෙහි අවධානය යොමු නොවීම පිළිබඳව ද අපි සැලකිලිමත් වෙමු. අවම පහසුකම් සහිත ජනාකීර්ණ අවකාශවල සිටින සිරකරුවන් සහ ඇඟලුම් කම්හල්වල සේවකයින් මෙයට ඇතුළත් විය යුතු අතර, ඔවුන්ගෙන් සමහරෙකුට අසනීප, ගැබ් ගැනීම් සහ සේවා ස්ථානයේ සෞඛ්‍ය පූර්වෝපායන් නොමැතිකම තිබියදීත් වැඩ කිරීමට බල කෙරී ඇත. තව ද නිරෝධායනය සහ සංචරණ සීමා පැනවීම නිසා ආදායම් අහිමි වූ සහ කුඩා හා ජනාකීර්ණ නිවාසවල, නේවාසිකාගාරවල බලහත්කාරයෙන් නිරෝධායනය කිරීමට ලක්වූවන් හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් ලෙස ලබා දී නොමැති බව ද අපි සටහන් කරමු. එසේම, නිරෝධායන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදි මිනිසුන් වෙනස් කොට සැලකීම, විශේෂයෙන්ම ඒ ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් අසා අප විමතියට පත්ව ඇත්තෙමු.

පසුගිය සති කිහිපය, COVID-19 සිද්ධීන් හා ඒ ආශ්‍රිතව සිදුවූ මරණ සම්බන්දයෙන් ශ්‍රී ලංකාවේ නරකම මාසය වූ අතර අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ විසම්මුතිය පුළුල් ලෙස මර්දනය කිරීම් ද මෙම කාලය තුල අප දුටු අවස්ථාවන් වේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින්, මාධ්‍යයට ප්‍රකාශ නිකුත් කරන සෞඛ්‍ය කාර්‍ය මණ්ඩලයට එරෙහිව පියවර ගන්නා බවට තර්ජනය කරමින් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. එසේම සෞඛ්‍ය නිලධාරීන්, තොරතුරු හා යෝජනා මාධ්‍ය හරහා ජනතාව සමග බෙදා ගැනීමට වඩා තමන් සමග බෙදා ගත යුතු බව ජනාධිපතිවරයා පවසා ඇති බව වාර්තා වේ. වෛද්‍ය චමිල සංජය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ විනය පරීක්ෂණයකට මුහුණ දී සිටින අතර ඔහු බියවී සිටින්නේ ඔහුගේ ලිපි සහ මාධ්‍ය වෙත ඔහු ලබා දුන් සම්මුඛ සාකච්ඡා හේතුවෙන් මෙය සිදුවූ බවට යි. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන චමිල ජයසිංහ මහතා අතඩංගුවට ගෙන තිබුනේ පාරිසරික විනාශය පිළිබඳ ෆේස්බුක් සටහනක් සම්බන්ධයෙන් ය. ප්‍රභූ පන්තියේ පුද්ගලයෙකු මාර්ගයේ ගමන් කිරීම නිසා සිදුවූ අනපේක්ෂිත මාර්ග තදබදයකට සිය අප්‍රසාදය, වාහන නලා ශබ්ද කරමින් පලකරන ලෙසට මෝටර් රථ රියදුරන්ගෙන් ඉල්ලා සිටි තරුණයෙකු කොළඹදී

අත් අඩංගුවට ගෙන තිබුනී. මේ වසර මුලදී පැවති අනුස්මරණ උත්සවයක් සම්බන්ධයෙන් කදුකරයේ මාධ්‍යවේදියෙකු සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් බිය ගැන්වීම්වලට මුහුණ දී තිබුනි.

අතිශයින් මිලිටරීකරණය වූ මුලතිවූ දිස්ත්‍රික්කයේ, හමුදා නිලධාරීන් මාර්ගය අසල මුරපොලක දී මාධ්‍යවේදියෙකුට තම වෘත්තීය රාජකාරි සඳහා ගමන් කිරීම නැවැත්වීමට උත්සාහ කලේ මාධ්‍යවේදීන්ට සංචාරය කිරීමට අවසර ඇති බව ප්‍රාදේශීය පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් තහවුරු කර තිබියදීත් ය. යුද්ධයෙන් මියගිය අය සිහිපත් කිරීම සඳහා නව අනුස්මරණ සමරුඵලකයක් දැඩි මිලිටරීකරණයක් මධ්‍යයේ වුව මුලතිවූ දිස්ත්‍රික්කයේ මුල්ලිවයිකල් ගම්මානයේ ඉදිකිරීමට ගිය ද එය ඉදිකිරීමට පෙර එක් රැයකින් අතුරුදන් විය. එදිනම රාත්‍රියේ එම ස්ථානයේ ඉදිකර තිබූ ස්මාරකයකට ද හානි වී තිබුනී. සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව යුද්ධයෙන් මියගිය අය වෙනුවෙන් අනුස්මරණ උත්සව පැවැත්වීමට උත්සාහ කරන විට උතුරු හා නැගෙනහිර දෙමළ දේශපාලනඥයින් ආගමික පූජකයන්, ක්‍රියාකාරීන් සහ ප්‍රජා නායකයින් හට බිය ගැන්වීම් සහ අධිකරණ නියෝග වලට මුහුණ දීමට සිදුවිය. දෙමළ මාධ්‍යවේදියෙකු මාස 6 කට වැඩි කාලයක් රඳවාගෙන සිටින්නේ මියගිය එල්ටීටීඊ සාමාජිකයින් සැමරීම පිළිබඳව අදහස් ප්‍රකාශ කරමින් තැබූ ෆේස්බුක් සටහනක් පදනම් කරගෙන යැයි කියනු ලැබේ.

උතුරු නගරයේ චිලවතුරෙයි හි වෙසෙන 26 හැවිරිදි මුස්ලිම් කවියෙකු වන අහ්නාෆ් ජසීම්ව නීත්‍යානුකූලභාවය සමාලෝචනය කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් නොකර, කිසිදු චෝදනාවකින් තොරව වසරකට වැඩි කාලයක් සිරගතකොට ඇත. ඔහුගේ නීතිඥයින්ට නිතිපතා ඔහුව හමුවීමට ඇති අවස්ථාවන් මෙන්ම ඔහුගේ පවුලේ සාමාජිකයන් බැලීමට හෝ ඇමතීමට ප්‍රමාණවත් අවස්ථාවන් ද නොලැබුණි. ඔහුට ප්‍රමාණවත් ආහාර හා සෞඛ්‍ය පහසුකම් ලබා දී නොමැති අතර වෙනස් කොට සැලකීම, කුරිරු, අමානුෂික හා පහත් සැලකිලි වලට ද යටත් වීමට සිදුවී ඇත. ඔහුගේ පවුලේ අය සහ නීතිඥයින් සැක කරන්නේ මෙය ඔහු නිදහස් කර ගැනීමට දරන උත්සාහයට එරෙහි පළිගැනීම් සහ ඔහු ස්වයං-වරදකරුවෙකු ලෙස ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට ඔහුට බල කිරීමට පොලීසිය ගත් උත්සාහයන්ගෙන් කොටසක් බවයි. ඔහුව අත් අඩංගුවට ගැනීම, වසරකට වැඩි කාලයක් රැඳවුම් භාරයේ සිටින සුලුතර අයිතිවාසිකම් පිලිබඳ ක්‍රියාකාරියෙකු මෙන්ම මානව හිමිකම් නීතිඥවරයෙකු වන මුස්ලිම් නීතිඥ හෙජාස් හිස්බුල්ලා වරදකරු කිරීමට ආශ්‍රිතව ගත් උත්සාහයක් යැයි මාධ්‍ය වාර්තා චෝදනා කරයි. මාස 11 ක පමණ කාලයක් රඳවා තබා ගැනීමෙන් පසු හිජාස්ට එරෙහිව අධිචෝදනා ගොනු කර ඇති නමුත් මාධ්‍ය වාර්තා වලින් ඔබ්බට ඇති තොරතුරු කිසිවක් ඔහුගේ නීතිඥයින්ට දන්වා නොමැත. හිජාස්ට සම්බන්දව ප්‍රකාශ නිකුත් කිරීමට තමන් බිය ගැන්වූ බව ප්‍රකාශ කරමින් ළමයින් කිහිප දෙනෙකු සහ ගුරුවරුන් දෙදෙනෙකු මූලික අයිතිවාසිකම් නඩු පවරා ඇති අතර, මාධ්‍ය වාර්තාවල දැක්වෙන්නේ ඔහුට එරෙහිව ඇති අධිචෝදනාව එක් දරුවෙකුගේ සාක්ෂි මත පදනම් විය හැකි බවයි. පසුගිය වසරේදී කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් පොලීසිය මගින් මෙහෙය වූ දෝෂ සහිත හඳුනා ගැනීමේ පෙරැට්ටුවක් අවලංගු කල අතර ඔහුට (මහේස්ත්‍රාත්වරයාට) ලබා දුන් රහස්‍ය සාක්ෂි මාධ්‍යයට කාන්දු වූයේ කෙසේද යන්න පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට ද නියෝග කර තිබුනි. අහ්නාෆ් සහ හෙජාස් යන දෙදෙනාම ඉස්ලාමීය අන්තවාදය පිළිබඳව ප්‍රසිද්ධියේ විවේචනය කල අතර පාස්කු බෝම්බ ප්‍රහාරය දැඩි ලෙස හෙළා දැක තිබේ. අප ද විධිමත් චෝදනාවකින් තොරව පාස්කු ප්‍රහාරයෙන් පසු රැඳවුම්

භාරයේ සිටින මුස්ලිම්වරුන් 300 ක් පමණ ගැන සැලකිලිමත් වෙමු. පාස්කු බෝම්බ ප්‍රහාරයේ මහ මොළකරුවන් සහ ආධාර සහ අනුබල දුන් අය ඇතුළුව, සමස්ථ පාස්කු ප්‍රහාරය සඳහා අප යුක්තිය ඉල්ලා සිටින නමුත්, එය විය යුත්තේ නීතියේ ආධිපත්‍යය, සාධාරණ නඩු විභාග සහ සැකකරුවන්ගේ සහ චූදිතයන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන ක්‍රියාවලියක් හරහා ය.

අවසාන වශයෙන්, සිරකරුවන්, කර්මාන්තශාලා සේවකයින්, දෛනික වැටුප් හිමිකරුවන් වැනි අවදානමට ලක්විය හැකි ජනතාවට එන්නත්කරණය, PCR පරීක්ෂණ සහ සෞඛ්‍ය ක්‍රියාමාර්ග මෙන්ම මානුෂීය සහාය ද ලබා දිය යුතු බව අප මතක් කර සිටිමු. සෞඛ්‍යය, ආහාර යනාදිය සඳහා ඇති අයිතිවාසිකම් සැලකිය යුත්තේ ජනතාවගේ අයිතිවාසිකම් සහ රජයේ යුතුකම් ලෙස මිස පාලකයන්ට ඔවුන්ගේ අභිමතය පරිදි ජනතාවට ලබාදිය හැකි දේවල් ලෙස නොව. මෙවැනි හදිසි අවස්ථාවකදී වසංගතය පිළිබඳ උපරිම තොරතුරු සහ අදහස්, මුද්‍රණ, විද්‍යුත් හා වෙබ් මාධ්‍ය හරහා ලබා ගැනීමට ජනතාවට හැකිවිය යුතුය. වෛද්‍ය නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන්, මාර්ගගත විචාරකයින්, පරිසරවේදීන් සහ වෙනත් විකල්ප අදහස් හා තොරතුරු ප්‍රශ්න කිරීම්, විවේචනය කිරීම් සහ රජයට අභියෝග කිරීම් කරන්නන් ගෙන් රජය පළිගැනීම් නොකළ යුතුය. වසංගතය සමඟ කටයුතු කිරීම සඳහා අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වන අතර අයිතිවාසිකම් මත පනවන කිසිදු සීමාවක් වෙනස් කොට සැලකීමක් නොවිය යුතුය. ඒවා අවශ්‍යතාවයන්ට සමානුපාතිකව කාල සීමාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නීතියෙන් නියම කළ යුතුය.